# මාධ්‍ය නිවේදනය

සන්නිවේදන දෙපාර්තමේන්තුව, 30, ජනාධිපති මාවත, කොළඹ 01, ශ්‍රී ලංකාව
+94 11 2477424 / +94 11 2477423 +94 11 2346257
communications@cbsl.lk / dcommunications@cbsl.lk www.cbsl.gov.lk

ශ්‍රී ලංකා මහ බැංකුව
இலங்கை மத்திய வங்கி
CENTRAL BANK OF SRI LANKA


| නිකුත් කළේ | සංඛ්‍යාන දෙපාර්තමේන්තුව |
|---|---|
| දිනය | 2022.10.31 |

## 2021 ඔක්තෝබර් මාසයේ සිට දක්නට ලැබුණු අඛණ්ඩ ඉහළ යෑමේ ප්‍රවණතාව වෙනස් කරමින් කො.පා.මි.ද. මත පදනම් වූ මතුපිට උද්ධමනය 2022 ඔක්තෝබර් මාසයේ දී සියයට 66.0ක් වාර්තා කළේය.

| උද්ධමනය | 2022 සැප්තැම්බර් | 2022 ඔක්තෝබර් |
|---|---|---|
| **මතුපිට** | | |
| දර්ශක අගය | 244.7 | 243.8 |
| මාසික වෙනස (%) | 3.8 | -0.4 |
| වාර්ෂික ලක්ෂ්‍යමය උද්ධමනය (%) | 69.8 | 66.0 |
| වාර්ෂික සාමාන්‍ය උද්ධමනය (%) | 33.4 | 38.3 |
| **මූලික** | | |
| දර්ශක අගය | 219.3 | 221.4 |
| මාසික වෙනස (%) | 3.4 | 1.0 |
| වාර්ෂික ලක්ෂ්‍යමය උද්ධමනය (%) | 50.2 | 49.7 |
| වාර්ෂික සාමාන්‍ය උද්ධමනය (%) | 24.1 | 27.8 |

2021 ඔක්තෝබර් මාසයේ සිට ඉහළ යෑමේ ප්‍රවණතාවක් අනුගමනය කරන ලද කොළඹ පාරිභෝගික මිල දර්ශකයෙහි (කො.පා.මි.ද., 2013=100)[1] වාර්ෂික ලක්ෂ්‍යමය වෙනස මගින් මනිනු ලබන මතුපිට උද්ධමනය, 2022 සැප්තැම්බර් මාසයේ පැවති සියයට 69.8හි සිට 2022 ඔක්තෝබර් මාසයේ දී සියයට 66.0ක් දක්වා පහළ ගියේය. එම ප්‍රවණතාවම අනුගමනය කරමින්, ආහාර කාණ්ඩයෙහි වාර්ෂික ලක්ෂ්‍යමය උද්ධමනය 2022 සැප්තැම්බර් මාසයේ පැවති සියයට 94.9හි සිට 2022 ඔක්තෝබර් මාසයේ දී සියයට 85.6 දක්වා පහළ ගිය අතර, ආහාර නොවන කාණ්ඩයෙහි වාර්ෂික ලක්ෂ්‍යමය උද්ධමනය 2022 සැප්තැම්බර් මාසයේ පැවති සියයට 57.6හි සිට 2022 ඔක්තෝබර් මාසයේ දී සියයට 56.3 දක්වා පහළ ගියේය.

මාසික වෙනස මගින් මනිනු ලබන කො.පා.මි. දර්ශකය මාස දාහතකට පසුව, 2022 ඔක්තෝබර් මාසයේ දී සියයට 0.35කින් පහළ ගියේය. මෙයට ප්‍රධාන වශයෙන් දායක වූයේ ආහාර කාණ්ඩයේ අයිතමවල මිල ගණන් මාසිකව සියයට 0.75කින් පහළ යෑමයි. ඒ අනුව, ආහාර කාණ්ඩය තුළ, නැවුම් මත්ස්‍ය, කරවල සහ සහල් මිල ගණන්හි සැලකිය යුතු පහළ යෑම් දක්නට ලැබුණි. එසේ වුවද, 2022 ඔක්තෝබර් මාසයේ දී සන්නිවේදන (ජංගම දුරකථන, ස්ථාවර දුරකථන සහ අන්තර්ජාල ගාස්තු), රෙදිපිළි සහ පාවහන්, ආපනශාලා සහ හෝටල් යන උප කාණ්ඩයන්හි අයිතමවල මිල ගණන් ඉහළ යෑම හේතුවෙන් ආහාර නොවන කාණ්ඩයේ මාසික ඉහළ යෑමක් වාර්තා විය. කෙසේ වුවද, 2022 ඔක්තෝබර් මාසය තුළ දී ප්‍රවාහන (පෙට්‍රල් සහ ඩීසල්) උප කාණ්ඩයේ අයිතමවල මිල ගණන් පහළ යෑම ආහාර නොවන කාණ්ඩයේ සමස්ත මාසික ඉහළ යෑම සැලකිය යුතු ලෙස අවම කිරීමට හේතු විය.

තවද, වාර්ෂික සාමාන්‍ය උද්ධමනය, 2022 සැප්තැම්බර් මාසයේ පැවති සියයට 33.4හි සිට 2022 ඔක්තෝබර් මාසයේ දී සියයට 38.3 දක්වා ඉහළ ගියේය.

**කො.පා.මි.ද. වාර්ෂික ලක්ෂ්‍යමය උද්ධමනයේ විචලනය (ප්‍රතිශත වෙනස)**




**කො.පා.මි.ද. මාසික ප්‍රතිශත වෙනස සඳහා දායකත්වය**




ආර්ථිකයේ යටිදැරි උද්ධමනය පිළිබිඹු කරන වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත මූලික උද්ධමනය, 2022 සැප්තැම්බර් මාසයේ පැවති සියයට 50.2හි සිට 2022 ඔක්තෝබර් මාසයේ දී සියයට 49.7 දක්වා පහළ ගිය අතර, වාර්ෂික සාමාන්‍ය මූලික උද්ධමනය, 2022 සැප්තැම්බර් මාසයේ පැවති සියයට 24.1හි සිට 2022 ඔක්තෝබර් මාසයේ දී සියයට 27.8 දක්වා ඉහළ ගියේය.

---

[1] කොළඹ පාරිභෝගික මිල දර්ශකය (කො.පා.මි.ද., 2013=100), ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් සම්පාදනය කරනු ලබන අතර එමගින් කොළඹ දිස්ත්‍රික්කයේ නාගරික ප්‍රදේශවල කුටුම්බ විසින් මිලදී ගන්නා භාණ්ඩ හා සේවාවල මිලෙහි සාමාන්‍ය වෙනස්වීම් පෙන්නුම් කරනු ලබයි.

## උප කාණ්ඩ අනුව කො.පා.මි.ද. මත පදනම් වූ මතුපිට උද්ධමනය
## (වාර්ෂික ලක්ෂ්‍යමය ප්‍රතිශත වෙනස)




## කොළඹ පාරිභෝගික මිල දර්ශකයෙහි (2013=100) හැසිරීම

| කාලපරිච්ඡේදය | | දර්ශක අගය | | මාසික % වෙනස | | වාර්ෂික ලක්ෂ්‍යමය % වෙනස | | වාර්ෂික සාමාන්‍ය % වෙනස | |
|---|---|---|---|---|---|---|---|---|---|
| වසර | මාසය | කො.පා.මි.ද. | කො.පා.මි.ද. (මූලික) | කො.පා.මි.ද. | කො.පා.මි.ද. (මූලික) | කො.පා.මි.ද. | කො.පා.මි.ද. (මූලික) | කො.පා.මි.ද. | කො.පා.මි.ද. (මූලික) |
| 2021 | ඔක්තෝබර් | 146.9 | 147.9 | 1.9 | 1.3 | 7.6 | 6.3 | 4.8 | 3.6 |
| | නොවැම්බර් | 150.7 | 149.4 | 2.6 | 1.0 | 9.9 | 7.0 | 5.3 | 4.0 |
| | දෙසැම්බර් | 154.7 | 151.3 | 2.7 | 1.3 | 12.1 | 8.3 | 6.0 | 4.4 |
| 2022 | ජනවාරි | 158.4 | 154.1 | 2.4 | 1.9 | 14.2 | 9.9 | 6.9 | 5.0 |
| | පෙබරවාරි | 160.1 | 155.7 | 1.1 | 1.0 | 15.1 | 10.9 | 7.9 | 5.7 |
| | මාර්තු | 164.9 | 159.4 | 3.0 | 2.4 | 18.7 | 13.0 | 9.1 | 6.5 |
| | අප්‍රේල් | 180.2 | 172.4 | 9.3 | 8.2 | 29.8 | 22.0 | 11.3 | 8.1 |
| | මැයි | 195.2 | 182.9 | 8.3 | 6.1 | 39.1 | 28.4 | 14.2 | 10.2 |
| | ජූනි | 220.2 | 200.2 | 12.8 | 9.5 | 54.6 | 39.9 | 18.4 | 13.3 |
| | ජූලි | 230.1 | 208.0 | 4.5 | 3.9 | 60.8 | 44.3 | 23.1 | 16.7 |
| | අගෝස්තු | 235.8 | 212.0 | 2.5 | 1.9 | 64.3 | 46.6 | 28.0 | 20.3 |
| | සැප්තැම්බර් | 244.7 | 219.3 | 3.8 | 3.4 | 69.8 | 50.2 | 33.4 | 24.1 |
| | ඔක්තෝබර් | 243.8 | 221.4 | -0.4 | 1.0 | 66.0 | 49.7 | 38.3 | 27.8 |

මූලය : ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව